ටෙන්ඩර් කොන්දේසි

01. ගම්පහ ප්‍රාදේශීය සභාවේ ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි නොදිරන කසළ ටෙන්ඩරය සම්බන්ධව මින් ඉදිරියට ගම්පහ ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන කොන්දේසි කඩ කිරීමක් හෝ කඩකිරීමකට ඉඩ ප්‍රස්ථා ඇති නොකිරීමට මම එකඟ වෙමි.

02. ටෙන්ඩර් පිළිගත් බව දැනුම් දී දින 07ක් ඇතුළත සේවා ගිවිසුමකට එළඹීමට මා එකඟ වන බවත් නියමිත කාලය තුළ එකී අවශ්‍යතාවය ඉටු කිරිම පැහැර හැරියහොත් මවිසින් ඉදිරිපත් කර ඇති ටෙන්ඩරය අවලංගු කිරීමට සභාවට අයිතියක් ඇති බවත් මම පිළිගනිමි.

03. මවිසින් ටෙන්ඩර් මඟින් ලබා ගත් ගම්පහ ප්‍රාදේශීය සභාවේ ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි නොදිරන කසළ විකිණීමේ ටෙන්ඩරය අන් අයෙකු සතු කිරීම හෝ කොටස් වශයෙන් වෙනත් අයෙකුට පැවරීමට අවසර නැති බව මම පිළිගනිමි.

04. මෙම ටෙන්ඩර් මිල ගණන් 2026.12.31 දක්වා වලංගු බවට මම එකඟ වෙමි.

05. මෙම මිල ගණන් සඳහා රජයේ අනුමත බදු මුදල් ගෙවීමට මම එකඟ වෙමි.

06. ගිවිසුම්ගත කාල සීමාව තුළ ගම්පහ ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය පරිපාලක විසින් ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි නොදිරන කසළ ඇති බව දැනුම්දීමෙන් දින 03ක් ඇතුලත අදාළ ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි නොදිරන කසළ, ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථාන (ගනේමුල්ල, කතුරුවත්ත) වලින් ලබා ගැනීමට හා එම ලබා ගන්නා දින ප.ව.3.00ට පෙර එම මුදල් හා ඊට අදාළ රජයේ අනුමත බදු ගෙවීමට මම එකඟ වෙමි.

07. අදාළ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි නොදිරන කසළ වාහන වලට පැටවීම සඳහා සේවකයන් , උපකරණ සපයා ගැනිමට මම එකඟ වෙමි.

08. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් අයදුම්පත්, මුල් හා අනු පිටපත් ලෙස පිළියෙල කර 2026.03.06 දින පෙ.ව10.30 ට හෝ ඉන් පෙර ලැබෙන සේ **"සභාපති, ගම්පහ ප්‍රාදේශීය සභාව, මිරිස්වත්ත, මුදුන්ගොඩ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගම්පහ ප්‍රාදේශීය සභාවේ, ප්‍රධාන කාර්යාලයේ, ලේකම් නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. ටෙන්ඩර් දේපළහි නම හා මුල් හා අනු පිටපත් යනුවෙන් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය. ප්‍රමාද මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩර් භාර ගන්නා වේලාව ඉක්ම වූ වහාම පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේදී ගම්පහ ප්‍රාදේශීය සභා කුඩා ශ්‍රවනාගාරයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

09. ටෙන්ඩර් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ගම්පහ ප්‍රාදේශීය සභාව සතු බවත් මම පිළිගනිමි. ඉහත සඳහන් කොන්දේසි සියල්ල කියවා තේරුම්ගෙන එකී කොන්දේසිවලට යටත් 20.........ක් වූ.............මස.........දින ටෙන්ඩර් දැන්වීමේ කොන්දේසි පිළිගැනීමට යටත්ව ටෙන්ඩරය ඉදිරිපත් කරමි.

ටෙන්ඩර්කරුගේ නම :-..................................................................................

ටෙන්ඩර්කරුගේ ලිපිනය :-................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය :-........................... දිනය ..............